## දැයේ විරුවාණෙනි !

ඇස් ඉස් මස් ලේ දන්දෙමින්
සාරා සංඛ කල්පයක්
පෙරුම්පුරා ලැබීය
බුදුබව අප බෝ සතුන්

බුදුබව ලබන්නට
ලැබිය යුතුය මිනිසත්බව
මිනිසත් බව ලැබුවද
ජීවත්වන්නට රටක් තිබිය යුතුය
නිදහසේ

විරුවාණෙනි!
ඔබ ඇස් ඉස් මස් ලේ දන් දුන්නේ
බුදුබව පතා නොව
ඔබ දෙපා පුදකර
අපට දෙපයින් සිටින්නට
ලෝකයක් තනන්නටමය

දිව රෑ නොබලා
ඇසට නින්දද කුසට අහරද
පසෙක ලා
ජාති ආගම් බේද නොසලකා
ඔබ කරන මේ මානුෂීය මෙහෙයුමට
අප සදා ණයගැතිය විරුව

ඔබ ලද මේ ජය
අප නෙත් සතුටු කඳුලින් තෙත්කරයි
ඒ කඳුළුකැට මුතු කොට අමුණා
පළඳමි ඔබ ගෙලේ
ජාතියේ නාමයෙන්

♦ **චමේලා ශශිනි 12 L**
විද්‍යා අංශය
අනුලා විද්‍යාලය
නුගේගොඩ Sri Lanka

**To young readers:** Send us your poetry by post or e-mail to be published on this page.




**Children's Corner**

## Artificial Limbs කෘතිම අත් පා



The first specimen of artificial limb discovered archaeologically was found in a tomb in Capua, Italy, dating to 300 BC, and was made of copper and wood. Two artificial toes found on Egyptian mummies are even older, dating to 1295-664 BC. Armorers in the 15th and 16th centuries made artificial limbs out of iron for soldiers who lost limbs. Over the next several centuries, craftsmen began to develop artificial limbs from wood instead of metal because of the lighter weight of the material.

පුරාවිද්‍යා කැණීම් වලදී ප්‍රථම වරට ඉතාලියේ කැපුවා ප්‍රදේශයේ දී කෘතිම පාදයක් සොයා ගෙන ඇත. එය ක්‍රි: පූර්ව 300 පමණ පැරණි වන අතර තඹ සහ ලී වලින් සාදන ලද්දකි. ඊජිප්තුවේ පැරණි මෘත ශරීරවල තිබී සොයාගෙන ඇති කෘතිම මහපට ඇඟිලි දෙකක් තවත් පැරණිය. ඒවා ක්‍රි: පූ 1295-664 කාලයට අයත් බැව් කියති. 15 හා 16 ශත වර්ෂවල යුධ ඇඳුම් නිපදවන්නන් විසින් යුද්ධයේදී අත් පා අහිමි වූ සොල්දාදුවන් සඳහා යකඩෙන් කෘතිම අත්පා සාදන ලදී. තවත් සියවස් ගණනකට පසුව නිර්මාණ ශිල්පීහු සැහැල්ලු බව සඳහා ලෝහ වෙනුවට ලී භාවිතාකර කෘතිම අත් පා සෑදීම ඇරඹූහ.

♦ *Auntie Ramani* - *රමණි නැන්දා*


**BOC**

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

**ලංකා බැංකුව**
**BANK OF CEYLON**

**ලන්ඩන් ශාඛාව**

*වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.*

හෙට දවසේ සිහින සැබෑකරන
**NRFC ගිණුමක් අරඹන්න !**
*උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !*

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා **301** කි. ඉන් **256** කම කටයුතු පරිගණක ජාලගතකර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ***ආකර්ෂණීය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***

ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
***වැඩි විස්තර සඳහා :***

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**


# ආබාධිත රණවිරුවන් සඳහා කෘතිම පාද පරිත්‍යාග කිරීම නුගේගොඩ අනුලා විද්‍යාලයේ බෞද්ධ සංගමය මගින් 2009 - 05 - 05 දින සිදුකරන ලදී



ශ්‍රී ලංකාවේ සුප්‍රකට බෞද්ධ බාලිකා විද්‍යාලයක් වන කොළඹ නුගේගොඩ අනුලා විදුහල පසුගිය වෙසක් සමයේ ඉතා උතුම් කටයුත්තක යෙදුනාය. එය උතුරේ සංග්‍රාමය නිසා ආබාධිත තත්වයට පත්ව සිටින අප වීරෝදාර රණවිරුවන් වෙනුවෙන් කළ අගනා මෙහෙවරකි. අනුලා විද්‍යාලයේ බෞද්ධ සංගමය විසින් කෘතිම පාද රාශියක් ආබාධිත රණවිරුවන් පිරිසක් කැඳවා ගෙනැවිත් ඔවුන්ට පරිත්‍යාග කරන ලදී.




*ඔව්හු රණවිරුවන් වෙනුවෙන් විවිධ ප්‍රසංගයක්ද පැවැත්වූහ*







*නික්ම යන රණවිරුවන්ට බාලිකාවෝ අතවනා සුබ පතති*



මෙම අගනා කර්තව්‍යයට විද්‍යාලයේ ප්‍රධානාචාර්යතුමිය ඇතුළු ගුරු මණ්ඩලයද ශිෂ්‍යාවන්ද සහභාගි වූයේ ඉතා සැදැහැ සිතිනි. ආගමික වතාවත් සිදුකිරීමෙන් පසු භික්ෂූන් වහන්සේගේ අනුශාසනාවෙන් අනතුරුව ගුරු මහත්මීහු ද ශිෂ්‍යාවෝ ද සියතින්ම ආබාධිත රණවිරුවන්ට කෘතිම පා පැළඳ වූවෝය.එය ඉතා හැඟීම් බර අවස්ථාවක් විය. රණවිරුවෝද ඉතා කෘතඥපූර්වකව තමනට පරිත්‍යාග කළ කෘතිම පා පැළඳ ගත්හ. අනුලා හි ශිෂ්‍යාවන්ගේ විවිධ ප්‍රසංගයක්ද පැවැත්වුණි. මේ සියල්ල තුළ වූ කැපී පෙනෙන දෙය නම් රට වෙනුවෙන් මෙම රණවිරුවන් කළ කැපවීම අප රටෙහි ජනතාව ඉහළින් අගය කරන බවයි. උත්සවය අවසාන වී රණවිරුවන් නික්ම යද්දී ඔවුන් නැගුණු රථය ළඟට ගිය ගුරු මණ්ඩලය ද ශිෂ්‍යාවෝ ද බැතිමත් සිතින් ආචාර කරමින් සුබපැතූහ.

තිස් වසරකට ආසන්නව පැවත ආ කුරිරු යුද්ධය අවසානයකට පැමිණීම අපට ඉමහත් සැනසිල්ලකි. එසේම එම යුද්ධය අපට ඉතිරි කළ කටුක අවාසනාවන්ත දේද එමටය. ඒ අතර අපට නැතිවුණු ජීවිත ද ආබාධිත තත්වයට පත්ව අසරණ වූ ජනතාවක් ද වෙති. යළි යුද්ධයක් නොවන්නට අපි වගබලා ගතයුතු වෙමු. එසේම අප රට දැය වෙනුවෙන් දිවිපිදූ ඒ අභීත දූදරුවන්ද අප සදාකාලයට අමතක නොකරන් නෙමු. මෙම ආබාධිත රණවිරුවන්ට කරන සත්කාරයද ඒ කළගුණ සැලකීමේම කොටසකි.

♦ ***කීර්ති මලිගස්පේ***